# සිංහල සමාජයේ විවාහ මංගල්‍යයේ දී භාවිත මඟුල් පෝරුව පිළිබඳ සමාජ-සංස්කෘතික අධ්‍යයනයක්

එච්. එම්. සන්දලී ප්‍රියංවදා විජේසිරි[1]

මේ අධ්‍යයනයෙහි අරමුණ වන්නේ මඟුල් පෝරුව නැමැති සංස්කෘතිකාංගයෙහි පසුබිම, ඇරඹුම, විකාශය, පැවැත්ම හෙවත් ඒ වටා ගොඩ නැඟුණු චාරිත්‍ර වාරිත්‍ර, ඇදහිලි සහිත සම්ප්‍රදාය ද එහි නව ප්‍රවණතා ද යන අංශ ඔස්සේ ප්‍රස්තුතය පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් සිදු කරමින් එය සිංහල සමාජය හා සංස්කෘතිය සමඟ බද්ධ වන අන්දම පිරික්සීම යි. යථෝක්ත විෂය පිළිබඳ නොයෙක් අදහස් හා මතිමතාන්තර සහිත ලේඛන ස්වල්පයක් ඇතත් ප්‍රමාණවත් විමර්ශනයක් මෙතෙක් සිදු වී නොමැති වීම මේ අධ්‍යයනයට හේතු විය. මේ අධ්‍යයනයේ අරමුණ සඵල කරගැනීම සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර අධ්‍යයන හා සංයුක්ත තැටි ආදිය ද ද්විතීකික මූලාශ්‍රය වශයෙන් පොත් පත්, පුවත්පත් හා සඟරා ලිපි ලේඛන ආදිය ද තෘතීයික මූලාශ්‍ර වශයෙන් අන්තර්ජාලය ද යොදාගැනිණ. දත්ත ලබාගැනීමේ දුෂ්කරතාව ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වීම සහ පුද්ගලයාගෙන් පුද්ගලයාට අනුව දත්තවල ඇති ගතික ස්වභාවය මේ අධ්‍යයනයේ දී මතු වූ ප්‍රධාන ගැටලු වශයෙන් හඳුනාගත හැකි ය. අවසාන වශයෙන් මඟුල් පෝරුව නැමැති සංස්කෘතිකාංගය සිංහල ජන සමාජයත් භෞතික හා අභෞතික සංස්කෘතික පද්ධතියත් කෙරෙහි විසල් බලපෑමක් සිදු කරන බව විශද වෙයි.

**ප්‍රමුඛ පදඃ** මඟුල් පෝරුව, විවාහ මංගල්‍යය, සිංහල ජන සමාජය, සංස්කෘතිය

---

[1] සිංහල අධ්‍යයනාංශය